මාධ්‍ය නිවේදන අංක 03

# මැතිවරණ කොමිෂන් සභාව

## තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම්

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.04.25

### තැපැලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ඒ සඳහා සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්/ ආරක්ෂක අංශ නිලධාරීන් වෙත කරනු ලබන නිවේදනයයි.

1. තැපැලෙන් ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මේ වන විට සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කොමිෂන් සභා, පළාත් සභා සහ ව්‍යවස්ථාපිත සංස්ථා මණ්ඩල ප්‍රධානීන් වෙත යොමු කර ඇත.

2. 2020.04.25 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත සියලුම රජයේ නිලධාරීන්/සේවකයන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන්/සේවකයන්, තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/ සේවකයන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/සේවකයන් සහ ත්‍රිවිධ හමුදාවන්හි පොලිස් දෙපාර්තමේන්තුවේ සහ සක්‍රීය ආරක්ෂක සේවාවල යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායේ සාමාජික සාමාජිකාවන් මෙම මැතිවරණයේ දී තැපැලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබන අතර, තැපැලෙන් ඡන්දය දීම සඳහා වන ඉල්ලුම් පත්‍ර තේරීම් භාර නිලධාරීන් විසින් භාර ගැනීම 2020.03.16 මධ්‍යම රාත්‍රි 12.00 න් අවසන් වන බව දන්වා සිටිමි.

3. සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපැල් ඡන්ද අයදුම්පත් පෞද්ගලිකවම පරීක්ෂා කර බලා ඉල්ලුම්කරුගේ අනන්‍යතාව පිළිබඳව නිසැකවීමෙන් අනතුරුව අයදුම්පත සහතික කළ යුතුය. සහතික කරන ලද අයදුම්පත් හැකි වහාම ඡන්ද හිමියාගේ ඡන්දය ලියාපදිංචි දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත ලැබෙන සේ යැවිය යුතුය. තැපැල් ඡන්ද අයදුම්පත් භාරගන්නා දිනය නැවත දීර්ඝ කිරීමක් නොකරන බව අවධාරණය කරනු ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගන්නා අවසන් දෙදින තුළ දී සහතික කරන අයදුම්පත් තැපෑලට භාරදීම වෙනුවට ආසන්නතම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අතින් ගෙනවිත් භාරදීම වඩාත් සුදුසු බව සලකනු මැනවි.

4. තැපැල් ඡන්ද ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන 2019 ඡන්ද හිමි නාමලේඛන තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට (www.elections.gov.lk) පිවිසීමෙන් ද අංක 1919 මඟින් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ඇමතීමෙන් ද ලබාගත හැකිය. ඊට අමතරව අවශ්‍ය වන තොරතුරු ලබාගැනීම සඳහා 2019 ඡන්ද හිමි නාමලේඛන පහත සඳහන් ස්ථානවලදී ද ප්‍රදර්ශනය කෙරේ.

   - සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)
   - සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල
   - සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන ඡන්ද ප්‍රදේශයේ නාමලේඛනය
   - සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල }

5. ඉහත සඳහන් ස්ථානවලට අමතරව,

   * රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.
   * කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු මහලේකම් කාර්යාලය නාරාහේන්පිට, කොළඹ 05.
   * අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
   * රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 243/3/ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
   * තැපැල් මූලස්ථානය, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
   * ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මාලිගාවත්ත.
   * සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය බත්තරමුල්ල යන කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල සංකීර්ණවල ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරිගණක ආශ්‍රයෙන් අයදුම්කරුවන් වෙත ලබා දීමට කටයුතු කරනු ඇත.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.